ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு
Ministry of Fisheries, Aquatic and Ocean Resources

නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය
பிரதி அமைச்சரின் அலுவலகம்
Deputy Minister's Office

දුරකථන / தொலைபேசி / Tel. 0112338281
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail dep.ministersofficemof@gmail.com

මගේ අංකය / எனது இல / My Number: MF/DMO/MEDIA/26/1027
ඔබේ අංකය / உமது இல / Your Number:
දිනය / திகதி / Date: 2026.10.27

**මාධ්‍ය නිවේදනය**

**'අර්නබ්' (Arnab) සුළි කුණාටු අවදානම මධ්‍යයේ තවමත් මුහුදු සීමාවේ රැඳී සිටින බහුදින ධීවර යාත්‍රා සඳහා රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමක්.**

බෙන්ගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ වර්ධනය වී ඇති "අර්නබ්" (Arnab) සුළි කුණාටුව හේතුවෙන් අදාළ මුහුදු කලාපය තුළ අවදානම් සහගත තත්ත්වයක් නිර්මාණය වී ඇත. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2026 ඔක්තෝබර් 27 වන දින නිකුත් කරන ලද නිවේදනයට අනුව, මෙම සුළි කුණාටුව ඔක්තෝම්බර් 28 වන දින ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් වෙරළ තීරයෙන් ගොඩබිමට ඇතුළු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ හේතුවෙන් උතුරු අක්ෂාංශ 10 - 20 ත්, නැගෙනහිර දේශාංශ 80 - 95 ත් අතර මුහුදු ප්‍රදේශයේ සුළගේ වේගය විටෙක පැයට කිලෝමීටර් 80 - 140 ත් දක්වා ඉහළ යා හැකි අතර මුහුදු රළ මීටර් 3.0 - 4.0 ත් දක්වා ඉහළ යා හැකි බැවින් එම ගැඹුරු මුහුදු ප්‍රදේශවලට යාත්‍රා නොකරන ලෙස ධීවර ප්‍රජාවට දැඩිව අවවාද කර තිබේ. මෙම අයහපත් කාලගුණික තත්ත්වය මධ්‍යයේ ඉන්දියාවට ආසන්න මුහුදු සීමාවේ හඳුනාගත් බහුදින ධීවර යාත්‍රා 25කට ආසන්න සංඛ්‍යාවක් රැඳී සිටින බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සඳහන් කරයි. පවතින සුළි කුණාටුව හමුවේ මෙම යාත්‍රාවලට යළි ශ්‍රී ලංකාව බලා යාත්‍රා කිරීමට පැවති බාධාවන් සැලකිල්ලට ගනිමින් ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය ඊට කඩිනම් පියවර ගන්නා ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය හරහා ඉන්දීය රජයෙන් කරන ලද විශේෂ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින්, අදාළ යාත්‍රාවන් සඳහා මෙම අවදානම් සහගත තත්ත්වයෙන් ආරක්ෂා වීමට ඉන්දියානු දේශසීමාවට ඇතුළු වීමට අවසර ලබාගෙන තිබේ. එමෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව බලපෑමට ලක්වූ කලාපවලින් වහාම ඉවත්ව ආරක්ෂිත ස්ථාන වෙත ගමන් කරන ලෙසද එම යාත්‍රාවලට දන්වා තිබේ.

තවද, අදාළ මුහුදු ප්‍රදේශයේ රැඳී සිටින සියලුම යාත්‍රා හිමිකරුවන් වෙත, මෙම තත්ත්වය යටතේ ඉදිරියට අනුගමනය කළ යුතු නියමාකාර ක්‍රියාපටිපාටිය පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිල වශයෙන් දැනුවත් කර තිබේ. ඉදිරියේදී නිකුත් කෙරෙන කාලගුණික නිවේදන පිළිබඳව ද දැඩි අවධානයෙන් පසුවන ලෙස ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය සමස්ත ධීවර ප්‍රජාවගෙන් ඉල්ලා සිටී.

ස්තූතියි.

මෙයට විශ්වාසී,



ඒ.එම්.එම්.එම්. කරුනාරත්න,

මාධ්‍ය ලේකම්,

ධීවර, ජලජ හා සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ.